# මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

## දෙවන වාර පරීක්ෂණය - 2025

**10 ශ්‍රේණිය**

## සිංහල භාෂාව හා සාහිත්‍යය - III

නම/ විභාග අංකයඃ ……………………………………… කාලය : පැය 2 යි

**වැදගත් :**

★ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්න **පහකට** පමණක් උත්තර ලියන්න.
★ **1, 2, 3, 4** ප්‍රශ්නවලටත් **5, 6, 7** ප්‍රශ්නවලින් **එකකටත්** උත්තර සපයන්න.
★ මෙම ප්‍රශ්න පත්‍රයට නියමිත ලකුණු ගණන **80**කි.

(1) (i) සිට (x) තෙක් ඇති **සියලු ම** අනු කොටස්වලට කෙටි උත්තර ලියන්න. කිසියම් අනුකොටසකට ඔබ උත්තර **නොලියන්නේ නම්, එහි අංකය ලියා ඉදිරියෙන් ඉරක් අඳින්න.**

(i) “වී නවතාත් මේ නුවර ගත නොහැක්ක. තාගේ එයින් උපායෙක් නොවෙයි. හැර පියව”
(අ) මේ ප්‍රකාශය කරන ලද්දේ කවරකු විසින් ද?
(ආ) එය ශ්‍රවණය කළේ කවරෙකු ද?

(ii) පහත දැක්වෙන කවියේ ඉතිරි පද දෙක සම්පූර්ණ කරන්න.

දෙදෙන ම ඉඳ දෙ පිට
සව් සත සතන් තුටු කොට
(අ) …………………………………………
(ආ)…………………………………………

(iii) “එදා ඔවුන් මෙන් අද තමා ද වන මැද තනි වී සිටින බවත් එදා ඔවුන්ට මෙන් ම අද තමාට ද මග වැරදී තිබෙන සැටිත් ඈ දුටුවා ය.”

(අ) මෙහි ‘ඈ’ යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?
(ආ) ඉහත ප්‍රකාශය ඇතුළත් නවකතාව කුමක් ද?

(iv) (අ) පන්සිය පනස් ජාතක පොත ලියවුණු යුගය නම් කරන්න.
(ආ) පන්සිය පනස් ජාතක පොතට මූලාශ්‍ර කෘතිය නම් කරන්න.

(v) නිති නිරිඳුගෙ රැකවලෙහි නියුත්තෝ
රුති ලෙස රුපුනොද බිඳ ජය ගත්තෝ
පැති රෙන වෙණ නද බැඳුණු සිතැත්තෝ
අති නවි ගිලිහෙන බව නොම දත්තෝ

(අ) ඉහත කවියට අනුව වීණා නාදය ඇසෙන විට සිදුවන්නේ කුමක් ද?
(ආ) ඉහත කවිය ඇතුළත් කාව්‍ය ග්‍රන්ථයේ රචකයා කවුරුන් ද?

(vi) ඇස නැති දා පොත ගත්තේ කියන්ට ද
දත නැති දා උක් දඬු ගිනි තපින්ට ද

(අ) ඉහත කවිය ඇතුළත් විශේෂිත ජන කවි වර්ගය නම් කරන්න.
(ආ) කෘෂිකර්මාන්තය හා බැඳුණු ජන කවි වර්ග දෙකක් නම් කරන්න.

(vii) "ඔව් මං හිතනවා මිනිහා මැරිලයි කියලා හිර ගෙදරට යන මිනිස්සු උන් හටි හැටියෙ මැරෙනවා."

(අ) ඉහත ප්‍රකාශයේ සඳහන් 'මිනිහා' යනුවෙන් හඳුන්වන්නේ කවුරුන් ද?
(ආ) ඉහත ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද?

(viii) (අ) සතර කන් මන්ත්‍රණය සිදු වූයේ කුමන ස්ථානයක දී ද?
(ආ) එය රහසින් අසා සිටියේ කවුරුන් ද?

(ix) (අ) බැද්දේගම නව කතාව සිංහලයට අනුවර්තනය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(ආ) ඔහු විසින් රචනා කරන ලද තවත් ග්‍රන්ථයක් නම් කරන්න.

(x) (අ) ගුත්තිල කාව්‍ය රචනා වූ යුගය කුමක් ද?
(ආ) එකල රාජ්‍ය පාලකයා කවුරුන් ද?

(ලකුණු 02 × 10 = 20යි)

(2) පහත දැක්වෙන ගද්‍ය හා පද්‍ය පාඨ කියවා අසා ඇති ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.

(i) "දේවයන් වහන්ස, අපි සේනාව රැස් කොට ගෙන පළමු කොට කුඩා නුවරක් වට කොට ගනුම්හ. මම **<u>කුරුබිලියෙන්</u>** ඇතුළු නුවරට වැද, ඒ නුවර රජ්ජුරුවනට, 'දේවයනි, තොප හා අප හා සටන් කොට කාරියෙක් නැති; හුදෙක් **<u>අප නතු වව</u>**. තොපගේ රාජ්‍යය තොපට ම වන්නේ ය."

(අ) යටින් ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) 'සතර කන් මන්ත්‍රණය' කෙටියෙන් ලියන්න.

(ii) **<u>වර වෙණ</u>** නද අසමින් සිත සතොසින්
සර හැර සියොතුන් පියපත් විදමිනි
පුර ඔර වසමින් සිටි රහ කුම් වැනි
**<u>සුර සෙනඟට</u>** සුරසුන් පැනවූ වැනි

(අ) යටින් ඉරි ඇඳි පදවල අර්ථය ලියන්න.
(ආ) ඉහත කවියේ උපමාව හා උපමේය වෙන් කොට දක්වන්න.

(iii) "පුංචිමැණිකාට හා කර්ලිනාහාමිටත් වේලක් ඇර වේලක් කා මාස හයක් ගත කර ගැනීමට සෑහෙන තරම් ධාන්‍යයක් වත් ගෙයි ඉතිරි වී නොතිබුණේ ය. තමා ඉදිරියෙහි මැවී තුබුණ භය ජනක අවිනිශ්චිත අඳුරු අනාගතය විසින් ඈ නොසන්සුන් බවට පත් කරන ලද්දී ය.

(අ) පුංචිමැණිකා හා කර්ලිනාහාමි අතර පවත්නා ඥාති සම්බන්ධතාව කුමක් ද?
(ආ) ඈ නොසන්සුන් බවට පත් කරන අඳුරු අනාගතයට හේතුව කෙටියෙන් දක්වන්න.

(iv) තත මතු ද සින්දේ
**<u>පිළිමල්</u>** දප ද සින්දේ
යස දිගත ඇන්දේ
විජය **<u>සිරි සඳ</u>** ගෙන වැළැන්දේ

(අ) තද කළු අකුරින් මුද්‍රිත පදවල අර්ථය ලියන්න.
(ආ) කවියේ අර්ථය ලියන්න.

(v) එක් උන දාට උක් දණ්ඩේ පැණි සේමා
වෙන් උන දාට යක් දෙබරේ වද සේමා
ගොසින් ගොසින් කටු අත්තේ අග සේමා
ඉතින් ළදේ කරවිල තිබ්බටු සේමා

(අ) ඉහත කවියේ දැක්වෙන අනුප්‍රාස පදයක් උපුටා ලියන්න.
(ආ) මෙම කවියේ කියැවෙන මිනිස් ගති ස්වභාවය කුමක් ද?

(ලකුණු 4 × 5 = 20යි)

(3) ගුත්තිල ඇදුරුතුමාගේ වීණා නාදයේ මිහිරි බව රැස්ව සිටින,

- මිනිසුන්ගේ හැසිරීමේ ස්වභාවයත්
- සතුන්ගේ හැසිරීමේ ස්වභාවයත්
  අතිශයෝක්තියෙන් වර්ණනා කර ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

**නැතහොත්**

උම්මග්ග ජාතකයේ එන මහෞෂධ පඬිතුමාගේ,

- දුරදක්නා නුවණ හා
- උපායශීලි බව
  එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

(ලකුණු15යි)

(4) "හානා හීය පානා අඬහැරෙන් දැනේ" ජන කවි පෙළේ,

- උපදේශාත්මක අදහස් ඉදිරිපත් කිරීමත්
- පොදු ජනවහර යොදා ගැනීමත්
  සිදුකර ඇති ආකාරය එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් විමසන්න.

නැතහොත්

බැද්දේගම නවකතාවේ එන,

- පුංචිමැණිකාගේ අවාසනාවන්ත ඉරණම ද
- දිළිඳු බවින් මිනිසුන් පත් වී ඇති අසරණකම ද
  පිළිබඳ එක් කරුණකට උදාහරණ දෙක බැගින් දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 15යි)

★ 5, 6, 7 ප්‍රශ්නවලින් **එකකට** පමණක් උත්තර ලියන්න.

(5) ගුත්තිල කාව්‍ය සාර්ථක වීම සඳහා වෑත්තෑවේ හිමියන් යොදා ගෙන ඇති කාව්‍ය උපක්‍රම නිදසුන් **තුනක්** දක්වමින් විමසන්න.

(ලකුණු 10යි)

(6) බැද්දේගම ගමෙහි පරිහානිය සජීවී ආකාරයෙන් නිරූපනය කර ඇති අයුරු නිදසුන් **තුනක්** දෙමින් විමසන්න.

(ලකුණු 10යි)

(7) ගැමියා ලද ජීවන අත්දැකීම් කාව්‍යානුසාරයෙන් ප්‍රකාශනය 'හානා හීය පානා අඬහැරෙන් දැනේ' පාඩම ඇසුරෙන් උදාහරණ **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න.

(ලකුණු 10යි)

★★★